20.07.2023

ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

Learning Resource Center R De Mazenod College Kandana

## ගණිතය - I

පළමු වාර පරීක්ෂණය-2023 | 06 ශ්‍රේණිය | කාලය පැය 2

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01 වෘත්තයක අභ්‍යන්තරයේ ඇඳිය හැකි දිගින් වැඩිම රේඛාව හඳුන්වන නම ලියන්න

02 24501300 සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න. එකි සංඛ්‍යා නාමයද ලියන්න

03 හිස්තැන් සඳහා ගැලපෙන ඉලක්කම් ලියන්න

□8
× 7
26□

04 සංඛ්‍යා දෙකක් ගණක රාමු මගින් එකතු කරන ආකාරය රූපයේ දක්වේ. එම සංඛ්‍යා දෙකෙහි එකතුව නියමිත ගණක රාමුවේ දක්වන්න.




05 -2 හා 1 අතර ඇති නිඛිල සියල්ල ලියා දක්වන්න.

06 සෘජුකෝණ 2ක විශාලත්වයට සමාන කෝණය හඳුන්වන නම ලියන්න.

07 2, 3, 0 සහ 5 යන ඉලක්කම් වලින් එක් ඉලක්කමක් එක් වරක් පමණක් යොදා ගනිමින් ලිවිය හැකි ස්ථාන හතරේ විශාලතම සංඛ්‍යාව ලියන්න.

08 එකම කාලය දක්වෙන යුගල පමණක් යා කරන්න.

| | |
|---|---|
| තත්පර 90 | දින 02 |
| දින 3 | මිනිත්තු 1 තත්පර 50 |
| පැය 48 | පැය 72 |

09 -4, -3, 3 යන සංඛ්‍යා අතුරින් සුදුසු සංඛ්‍යාව යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න. -3 <............

10 පන්තියක සිටින සිසුන් සංඛ්‍යාව ආසන්න දහයේ ගුණාකාරයට වැටයූවිට 40ක් වේ. එම පන්තියේ සිටිය හැකි අඩුම සිසුන් ගණන කොපමණද ?

11. පහත ප්‍රකාශ (√) ලකුණද වැරදිනම් (X) ලකුණද යොදන්න.
1. එක් මිනිත්තුවකදී තත්පර කටුව වට 60ක් ගමන් කරයි ( )
2. තිබිල යනු බිංදුවද ඇතුළත් ධණ හෝ සෘණ පූර්ණ සංඛ්‍යාවේ ( )

12 මිල රුපියල් 17.00 වන පෑනක් සහ මිල රු. 6.00 වන මකනයක් මිලදී ගැනීම සඳහා රු. 100 නෝට්ටුවක් දුන් සුනිල්ට ලැබෙන ඉතිරි මුදල කීයද ?

13 පැය 50, දින සහ පැය වලින් දක්වන්න.

14 9425 832 420 මෙම සංඛ්‍යාව කලාප වලට වෙන් කර දහස්කලාපයට අයත් ඉලක්කම් කාණ්ඩය ලියා දක්වන්න.

15 ආසන්න 10 ගුණාකාරයට වටයන්න.
1. 53 = .............   2. 75 = .............

16 අගය සොයන්න.
1. 425 x 6   2. 1488 ÷ 12

17 පහත දී ඇති සංඛ්‍යා රේඛාව මත සලකුණු කර ඇති සංඛ්‍යා ආරෝහන පටිපාටියට ලියන්න.




18 එකතු කරන්න.

| දින | පැය | මිනිත්තු |
|---|---|---|
| 3 | 11 | 30 |
| +2 | 14 | 45 |

19 වෘත්තය මත පිහිටිම දක්වා ඇති අක්ෂර ලියන්න.




20 2018 අප්‍රේල් දෙවන දිනය අන්තර් ජාතික සම්මත ආකාරයට ලියන්න.

## II කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක්ද ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින්ද ලැබේ.

1) ........................................

a. ඉලක්කමක් ලියූ කාඩ්පත් තුන බැගින් ඇති A හා B නම් වූ පෙට්ටි 2ක් පහත දක්වේ.




A පෙට්ටියෙන් එක් කාඩ්පතක් හා B පෙට්ටියෙන් එක් කාඩ්පතක් තෝරාගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i. ඔබ තෝරාගත් නිඛිල දෙක සංඛ්‍යා රේඛාවක් මත ලකුණු කරන්න.

ii. < හෝ > අසමානතා ලකුණු යොදා නිඛිල දෙක සන්සන්ධනය කරන්න.

iii. A හා B පෙට්ටි දෙකෙහි ඇති නිඛිල සියල්ලම ආරෝහණ පටිපාටියට ලියන්න.

b. ළමයින් තිදෙනෙකුගේ වයස අවුරුදු වලින් නිරූපනය කළ පහත දක්වෙන සංඛ්‍යා රේඛාව භාවිතයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ළමයින් තිදෙනාගේ වයස ලියන්න.
හානුක- කසුන්- පසිඳු -

ii. කසුන් හානුකට වඩා අවුරුදු කීයක් වැඩිමල්ද ?

iii. පසිඳු ඉපදී ඇත්තේ 2011 වර්ෂයේනම් කසුන් ඉපදී ඇති වර්ෂය කුමක්ද ?

iv. සඳුන් හානුකට වඩා අවුරුදු 3කින් වැඩිමල්ය. සංඛ්‍යා රේඛාව ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන සඳුන්ගේ වයස එහි ලකුණු කරන්න.

2)

a. 1390240018

i. ඉහත සංඛ්‍යාව කලාප වලට වෙන් කරන්න.

ii. එම සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

b. "දෙබිලියන අටසිය තිස් මිලියක හාරසිය පනස්දහස් හත " යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න.

c. 45621

i. 5 හි ස්ථානීය අගය කුමක්ද?

ii. 6න් නිරූපනය වන අගය කුමක්ද ?

iii. ඉහත ලියූ සංඛ්‍යාවේ දසස්ථානයේ ඉලක්කමෙන් නිරූපනය වන අගය එකස්ථානයේ ඉලක්කමෙන් නිරූපනය වන අගයමෙන් කී ගුණයක්ද ?

3)

a. සුළු කරන්න.

i. 2358 + 794 =

ii. 5000 - 2657 =

iii. 78x26

iv. 26400 ÷ 100

b. දීර්ඝ බෙදීමේ ක්‍රමයෙන් සුළු කරන්න.

i. 4870 ÷ 15

ii. 3920 ÷ 13

4) පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව පෙරවරු 4.45ට අනුරාධපුරය බලා පාසලින් පිටත් වූ අතර නැවත පාසලට පැමිණියේ පස්වරු 9.20ටය.

i. නැවත පාසලට පැමිනි වේලාව සම්මත ආකාරයට ලියන්න.

ii. ගමනට ගතවූ මුළු කාලය කොපමණද ?

iii. ගමනට සහභාගී වූ සිසුන් ගණන 288 නම් එම සංඛ්‍යාව ආසන්න 10 ගුණාකාරයට වැටයීමෙන් ලියන්න.

iv. එක් බස් රථයක ගියන සිසුන් ගණන ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 50ක් විය. එක් බස් රථයක ගිය උපරිම සිසුන් ගණන කොපමණ විය හැකිද ?

v. එදින චාරිකාවට සහභාගි වීමට සමන් පෙ.ව. 4. 10ට නිවසින් ගමන් ආරම්භ කර මිනිත්තු 45කට පසු පාසලට පැමිණියේය. ඔහුට චාරිකාවට යාමට නොහැකි වන බව පෙන්වන්න.

5)

a. කෝණයක ඇති ප්‍රධාන අංග මොනවාද ?

b. ඔබ අවට ඇති දෑ වලින් සෘජුකෝණ හැඩය දක්නට ලැබෙන අවස්ථා 2ක් ලියන්න

c. දී ඇති රූප සටහනේ විවිධ වර්ගයේ කෝණ අටක් a සිට h තෙක් අක්ෂර වලින් නම් කර ඇත. ඒ ඇසුරින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. සුළු කෝන 2ක් නම් කරන්න.

ii. f මගින් නම් කර ඇත්තේ කුමන වර්ගයේ කෝණයක්ද ?

iii. මහා කෝණ 2 නම් කරන්න.

iv. a සහ e මගින් නම් කර ඇත්තේ කුමන වර්ගයේ කෝණයක්ද ?

6)

a. පන්තියක සිටින ළමුන් ගණන ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට පිළිතුරු 50 විය. ළමුන් 9 දෙනෙක් එම පන්තියට අලුතින් පැමිණියේය. එවිට එහි සිටින ළමුන් ගණන ආසන්න 10යේ ගුණාකාරයට වැටයූ විට පිළිතුර ද 50විය. මුලින් පන්තියේ සිටි ළමුන් ගණන කීයද? ල.3

b. පෙට්ටියක ඇති පැන්සල් ගණන ආසන්න 10යේ ගුණාකාරයට වැටයූ විට එය 80කි.

i. පෙට්ටියේ ඇති පැන්සල් ගණන විය හැකි අවම අගය කුමක්ද? ල.1

ii. පෙට්ටියේ ඇති පැන්සල් ගණණ විය හැකි උපරිම අගය කුමක්ද? ල.01

1.

| | දින | පැය |
|---|---|---|
| | 12 | 15 |
| - | 4 | 17 |

2.

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 9 | 20 |
| - | 8 | 40 |

3.

| | මිනිත්තු | තත්පර |
|---|---|---|
| | 13 | 05 |
| + | 7 | 57 |

ල.2